**රඹෑව ප්‍රාදේශීය සභාව -2023**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රඹෑව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රඹෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ** වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතියේ අංක 3.7 ජේදය ප්‍රකාරව අස්ථිත්වයක් පිළියෙල කළ අයවැය ලේඛනවල අයවැයගත තොරතුරු එම කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළයුතු වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය අයවැයගත තොරතුරු රහිතව ඉදිරිපත් කර තිබුණි. | පිළිගන්නා බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනාගත් රු.796,196 ක ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වටිනාකම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | පිළිගන්නා බව. | ප්‍රාග්ධන ප්‍රදාන විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දැක්විය යුතුය. |
| (ආ) | 2023 වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබී තිබුණු වටිනාකම රු.6,598,000 ක් වූ ට්‍රැක්ටර් 02 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ප්‍රාග්ධන ප්‍රදානයක් ලෙසත් වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ දේපළ, පිරියත සහ උපකරණ ලෙසත් දක්වා නොතිබුණි. | -එම- | ප්‍රාග්ධන වත්කම් ලැබීම් දේපළ, පිරියත හා උපකරණ යටතේ දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 සහ 2023 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු අවම මුද්දර ගාස්තු ආදායම රු.1,375,700 ක් විය යුතු වුවත් එය රු.250,000 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. එම නිසා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම එම වටිනාකමින් අඩුවී තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශේෂ පිරික්සුම අනුව ලී බඩුවල වටිනාකම රු.1,581,066 ක් වුවත් ලෙජර් ගිණුම හා 16 වන සටහන අනුව එය රු.1,287,835 ක් වීම නිසා රු.293,231 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | වෙනසට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ලෙජර් ගිණුම අනුව 2023 ජනවාරි 01 දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම හා මුද්දර ගාස්තු ආදායමේ එකතුව රු.2,511,862 ක් වුවත්, උපලේඛනය අනුව රු.705,633 ක් වූයෙන් රු.1,806,229 ක වෙනසක් විය. | -එම- | -එම- |

**1.6.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | තාවකාලික විශ්‍රාම වැටුප් | 57,927 | උපලේඛන, කාල විශ්ලේෂණ හා ශේෂ සනාථ කිරීම් | තොරතුරු සොයාගැනීමට නොහැකි බැවින් නිරවුල් කිරීමට නොහැකිවී ඇති බව. | තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | විවිධ | 287,369 | -එම- | -එම- | -එම- |
| (ඇ) | අත්තිකාරම් කොන්ත්‍රාත් | 20,000 | -එම- | -එම- | -එම- |
| (ඈ) | කොන්ත්‍රාත්කරුවන්ගේ ඇප | 63,080 | -එම- | -එම- | -එම- |
| (ඉ) | විවිධ ඇප තැන්පත් | 7,465 | -එම- | -එම- | -එම- |
| (ඊ) | වෙනත් තැන්පත් | 1,693 | -එම- | -එම- | -එම- |
| (උ) | උසාවි තැන්පත් | 9,486 | -එම- | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.10,685,007 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.15,326,002 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,471,502 | 1,881,326 | 2,204,794 | 3,098,448 | 2,267,502 | 2,564,612 | 1,566,997 | 3,421,916 |
| (ii) | කුලී | 15,561,000 | 8,043,815 | 8,172,475 | 5,785,490 | 11,780,000 | 4,877,120 | 4,257,224 | 5,914,150 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,038,620 | 1,104,910 | 755,650 | 1,455,260 | 1,788,620 | 1,464,010 | 1,098,880 | 1,106,000 |
| (iv) | වෙනත් ආදායම් | 8,150,802 | 7,963,248 | 7,707,012 | 2,791,324 | 7,540,080 | 2,162,575 | 4,996,473 | 2,535,088 |
| | | 28,221,924 | 18,993,299 | 18,839,931 | 13,130,522 | 23,376,202 | 11,068,317 | 11,919,574 | 12,977,154 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති රු.1,368,047 ක හිඟ වරිපනම්වලින් සියයට 61 ක් වූ රු.834,509 ක් අයකරගෙන නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා වූ වරිපනම් වලින් සියයට 43 ක් වූ රු.264,351 ක් අයකරගෙන නොතිබුණි.. | ඉදිරි කාලයේදී හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කරන බව. | ප්‍රවර්ථන වරිපනම් හා හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ආ) **කුලී**

| | | | |
|---|---|---|---|
| (i) | සභාවට අයත් කඩ කාමර 19 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු රු.1,987,010 ක කුලියෙන් සියයට 32 ක් වූ රු.643,960 ක් අයකරගෙන නොතිබුණි. | 2023 වර්ෂය සඳහා අංක 01,03 සහ 04 කඩ කාමර සඳහා ගිවිසුම්ගත නොවූ බැවින් අයකර ගැනීමට නොහැකි වී ඇති බව. | ගිවිසුම්ගතවී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | වත්කම් බදුදීම වෙනුවෙන් 2023 ජනවාරි 01 දිනට අයවිය යුතුව තිබූ රු.2,774,005 ක හිඟ කුලී 2023 වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීම සඳහා අදාළ බදුකරුවන් වෙත ලිපි යවා ඇති බව. | හිඟ කුලී අයකර ගැනීමට ක්‍රියාකළ යුතුය. |
| (iii) | 2019 වර්ෂයේ සිට පැවත එන වාහන තුනක් කුලියට දීම වෙනුවෙන් අයවිය යුතු රු.2,060,525 ක් 2023 වර්ෂයේදී ද අය කර ගෙන නොතිබුණි. | මෙම කුලී අයකරගත යුතු පුද්ගලයින් හඳුනා ගැනීමට නොහැකි වී ඇති බව හා ඒ පිළිබඳව විමර්ශනයක් සිදුකර ඇතත් මෙතෙක් වාර්තාවක් ලැබී නොමැති බව. | විමර්ශන වාර්තා ලබාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඇ) **බලපත්‍ර ගාස්තු**

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ බලපත්‍ර ගාස්තු වෙනුවෙන් අයවිය යුතු රු.352,750 ක් අයකර ගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | දැන්වීම් පුවරු වෙනුවෙන් අයවිය යුතු හිඟ ගාස්තු රු.317,510 ක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන නොතිබුණි. | මෙම හිඟ මුදලින් කොටසක් ලැබී ඇති බව හා ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට නඩු පැවරීමට කටයුතු කරන බව. | හිඟ දැන්වීම් පුවරු ගාස්තු අයකරගත යුතුය. |

(ඈ) **වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,411,916 ක් හා මුද්දර ගාස්තු රු.250,000 ක් ලැබී නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් එම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | පිළිගන්නා බව. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 දූශ්‍ය අක්‍රමිකතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාස 02 තුළ සරප් වෙත දෛනිකව ලැබී තිබුණු රු.349,515 ක් සහා අරමුදල වෙත බැර නොකර වංචා කිරීම සම්බන්ධයෙන් සරප් තනතුරේ රාජකාරි කළ නිලධාරිණියකගේ වැඩ තහනම් කර තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් සිදුකර වගකිවයුතු පාර්ශවය වෙතින් අලාභය අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා රීති 13, 14, 15 අනුව කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධ පරීක්ෂණ මේ වනවිට පැවැත්වෙන බව හා වාර්තා ලද පසු මූල්‍ය රීති 13, 14 සහ 15 පරිදි කටයුතු කරන බව. | පරීක්ෂණ වාර්තාවල නිර්දේශ අනුව ක්‍රියාකළ යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වලවාහැංගුනුවැව පිහිටි ප්‍රති ආශ්‍රිත (RO) ජල පෙරණ පද්ධතිය මගින් අලෙවි කරන ජලය වෙනුවෙන් සභාවට කිසිඳු ආදායමක් ලැබී නොතිබුණි. | වලවාහැංගුනුවැව RO ජල පෙරණය මගින් මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | පරීක්ෂා කිරීම් සිදුකර මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රඹෑව සතිපොළ පිළිබඳව විධිමත් සමීක්ෂණයක් සිදුනොකිරීම හා ආදායම් එකතු කිරීම පිළිබඳව අධීක්ෂණය නොකිරීම නිසා සතිපොළෙන් ලැබිය යුතු නිවැරදි ආදායම සභාව වෙත ලැබී නොතිබුණි. | මෙම සතිපොළ පිළිබඳ විධිමත් සමීක්ෂණයක් සිදුකර නිශ්චිත ගාස්තු තීරණය කර අයකර ගැනීමට කටයුතු කරන බව. | සමීක්ෂණ සිදුකර ගාස්තු නිවැරදිව අයකරගත යුතුය. |
| (ඇ) | රඹෑව සතිපොළ භූමියේ ඉදිකර තිබුණු මාළු අලෙවි කුටි උසින් වැඩි ලෙස ඉදිකර තිබීම නිසා ඒවා නිෂ්කාර්යව පැවතුණි. | සතිපොළ නවීකරණය කිරීමේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අවශ්‍ය නිවැරදි කිරීම් කඩිනම් කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රඹෑව සතිපොළ පරිශ්‍රය වටා ආරක්ෂිත වැටක් හා ගේට්ටු යොදා නොමැතිවීම නිසා එහි වැසිකිලි පද්ධතියේ තිබුණු උපකරණ සොරුන් විසින් ගලවාගෙන ගොස් තිබුණු අතර පොළ භූමිය මත්ද්‍රව්‍ය අලෙවි කිරීම සහ වෙනත් නීති විරෝධී ක්‍රියා සඳහා භාවිත කරමින් පැවතුණි. | සතිපොළ නවීකරණය කිරීමේදී මේ තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අවශ්‍ය නිවැරදි කිරීම් කඩිනම් කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1. වාෂරීක ක්‍රියාකාරී සැලස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාර්ෂික අයවැය අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | පිළිගන්නා බව. | අයවැය අනුකූල වන පරිදි වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 වර්ෂයේදී ආරම්භ කරන ලද සඳමල්ගම පිහිටි අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා පරිසර බලපත්‍රයක් 2023 වර්ෂයේදී ද ලබාගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | පරිසර බලපත්‍රයක් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |